පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සති පාසල

විෂය:- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය :

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

(1) ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දැක්වේ.

A. හවුල් ව්‍යාපාර B. සීමිත සමාගම් C. කේවල ස්වාමි ව්‍යාපාර
D. සමූපකාර E. රාජ්‍ය සමාගම් F. දෙපාර්තමේන්ත
G. රාජ්‍ය සංස්ථා

මේවා අතුරෙන් පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A, D, E (2) B, D, F (3) C, F, G (4) E, F, G

(2) කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල දැකිය නොහැකි එහෙත් සීමිත සමාගම්වල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) අරමුණක් තිබීම ය. (2) ආර්ථික කටයුත්තක නියැලීම ය.
(3) නෛතික පුද්ගලභාවයක් පැවතීම ය. (4) පැවැත්මක් තිබීම ය.

(3) අයිතිය අනුව ව්‍යාපාර ප්‍රධාන වශයෙන් වර්ගකර දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප්‍රාථමික හා ද්විතීයික (2) සුළු හා මහා පරිමාණ
(3) තනි පුද්ගල හා හවුල් (4) පෞද්ගලික හා පොදු (රාජ්‍ය)

(4) ලොව බහුලව ම දැකිය හැකි ව්‍යාපාර සංවිධානය වන්නේ,

(1) සීමිත සමාගම් (2) සමූපකාර (3) හවුල් ව්‍යාපාරය
(4) තනි පුද්ගල ව්‍යාපාර

(5) තනි ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසියක් නොවන්නේ,

(1) ලාභ තනිව භුක්ති විඳිය හැකි වීම. (2) වගකීම් සීමිත වීම.
(3) පරිපාලනය පහසු වීම. (4) ආරවුල් නොමැති වීම.